පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
08

# අවසාන වාර පරීක්ෂණය - 2022

## පුරවැසි අධ්‍යාපනය I, II

පාසලේ නම : ..........................................................................................

ඇතුළත්වීමේ අංකය : ..............................

කාලය : පැය 02 යි.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි :**

❖ **සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

- **අංක 01 - 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා හිස්තැන් මත ලියා දක්වන්න.**

01. අප ජීවත් වන ප්‍රදේශයේ නීතිය හා සාමය සුරැකීම හා මහජන ආරක්ෂාව සැපයීම ..................................... ප්‍රධාන කාර්යභාරයකි. ( ග්‍රාම නිලධාරීතුමාගේ / පොලිසියේ / ත්‍රිවිධ හමුදාවේ )

02. සාගර පත්ලේ සිදුවන භූමිකම්පා නිසා ................................................ ඇති වේ. ( නායයෑම් / සුනාමි / සුළි සුළං )

03. මිනිසා සාමූහික ව කටයුතු කරන සෑම අවස්ථාවක ම ඔහු මෙහෙයවීම සඳහා ........................................ අවශ්‍ය වේ. (නායකයෙකු / අනුගාමිකයෙකු / මඟපෙන්වන්නෙකු )

04. එක් සංස්කෘතියක් තවත් සංස්කෘතියකින් වෙන් කර හඳුනා ගත හැකි වන්නේ සංස්කෘතික .......................................................... තුළිනි. ( ලැදියාව /අනන්‍යතාවය / ඒකීයත්වය )

05. තමන් කරන කාර්යය සතුටින් හා කැමැත්තෙන් යුතුව ඉටු කිරීම ............................................ නම් වේ. (ආත්මාභිමානය / ශ්‍රමාභිමානය / කාර්යක්ෂමතාවය)

- **ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රකාශ හරි නම් (√) ලකුණ ද වැරදි නම් ( X) ලකුණ ද ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

06. "එකා සැමටත් - සැම එකාටත්" යන්න සමූපකාරයේ ආදර්ශ පාඨයයි. (.............)

07. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියට අනුව වයස අවුරුදු 18 සම්පූර්ණ නොකළ පුද්ගලයෝ ළමයින් ලෙස පිළිගනිති. (.............)

08. වකුගඩු රෝග , පිළිකා , දියවැඩියාව වැනි රෝග බෝ වන රෝග වේ. (.............)

09. ඉන්දියාව බහු සංස්කෘතික සමාජයක් සහිත රටකි. (.............)

10. වර්තමානයේ බොහෝ රැකියා අවස්ථා සඳහා අධ්‍යාපන සුදුසුකම් පමණක් ප්‍රමාණවත් වේ. (.............)

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර දී ඇති පිළිතුරු අතරින් තෝරා යටින් ඉරක් අඳින්න.**

11. අධ්‍යාපනය මගින් ඉටු කරන කාර්යයකි.

(1) යහපත් පුරවැසියන් බිහි කිරීම. (2) මහජන ආරක්ෂාව සැපයීම.

(3) රෝගීන්ට ප්‍රතිකාර කිරීම. (4) ජනතා සුභසාධනයට දායක වීම.

12. නායකයෙකු සතු විය යුතු ගුණාංගයක් නොවන්නේ මින් කුමක්ද?

(1) සන්නිවේදන හැකියාව (2) මෙහෙයවීමේ හැකියාව

(3) වෙනස් වීමට කැමැති නොවීම (4) මානව සම්බන්ධතා

13. ජාතික ආරක්ෂාව පිළිබඳ මෙහෙයුම් මධ්‍යස්ථානයේ දුරකථන අංකය වන්නේ,

(1) 110 (2) 118 (3) 119 (4) 159

14. පුද්ගලයා තුළ හටගන්නා විවිධ චිත්තවේග අනුව විවිධ ප්‍රතික්‍රියා හා හැසිරීම් පෙන්නුම් කරයි. ඒ අනුව බියට පත් වූ විට ඇති වන හැසිරීම් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පහර දීම , හැඬීම , කෑගැසීම , බැණීම

(2) උඩ පැනීම , සතුටු කඳුළු සැලීම , කෑ ගැසීම , බැණීම

(3) පහර දීම , බැණීම , ඔල්වරසන් දීම , කෑ ගැසීම

(4) දෙපා වෙව්ලීම , ගොත ගැසීම , දහඩිය දැමීම , හැඬීම

15. වැඩි වශයෙන් මානසික ශ්‍රමය යොදවන රැකියාව මින් කුමක්ද?

(1) ගොවි (2) වෛද්‍ය (3) තේ දලු නෙළීම (4) කම්කරු

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ඇති (අ) කොටසේ ප්‍රශ්නවලට අදාළ පිළිතුර (ආ) කොටසින් තෝරා ඉදිරියේ ඇති වරහන තුළ අක්ෂරය යොදන්න.**

| | |
|---|---|
| (16) දරුවන්ගේ ආරක්ෂාව සම්බන්ධ ගැටළු විමර්ශනය හා සහාය ලබාදීම. (.................) | (A) සාධාරණ බව |
| (17) හින්දු භක්තිකයන්ගේ සංස්කෘතික උරුමයකි. (................) | (B) ප්‍රාදේශීය ළමා ආරක්ෂක නිලධාරී |
| (18) ස්වභාවික විපත් අවම කර ගැනීමට ගත යුතු එක් ක්‍රියාමාර්ගයකි. (..................) | (C) ජ්‍යෙෂ්ඨ පුරවැසියන් සඳහා සුභ සාධනය |
| (19) යහපත් ශ්‍රමිකයෙකු තුළ තිබිය යුතු ගුණාංගයකි. (................) | (D) නල්ලූර් කෝවිල |
| (20) රජය විසින් ක්‍රියාත්මක කරනු ලබන ගෞරවනීය සමාජ ආරක්ෂණ වැඩසටහනකි. (...................) | (E) වනාන්තර විනාශ නොකිරීම |

( ලකුණු 20 × 2 = 40 )

# පුරවැසි අධ්‍යාපනය II

වැදගත්

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නය ඇතුලු ව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. (i) බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ සේවා 02 ක් නම් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(ii) ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ක්‍රියාත්මක වන ආයතන 02 ක් නම් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(iii) බහු සංස්කෘතික සමාජයක පුරවසියෙක වශයෙන් කටයතු කිරිමේ දී අප විසින් අනුගමනය කළ යුතු ගුණාංග 02 ක් සඳහන් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(iv) වර්තමානයේ මුහුණ පෑමට සිදු වී ඇති අනතුරු හා විපත් ඒවායේ ස්වභාවය අනුව ප්‍රධාන කොටස් දෙකකට බෙදා දැක්විය හැකිය. එම කොටස් 02 ක ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(v) ළමයෙකු ලෙස ඔබට හිමි වන අයිතිවාසිකම් 02 ක් නම් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(vi) ශ්‍රී ලංකාවේ ජීවත් වන ජනවර්ග 02 ක් නම් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(vii) අභියෝග ජය ගැනීම සඳහා පුද්ගයෙකු සතු විය යුතු ගුණාංග 02 ක් ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(viii) අයහපත් චිත්තවේග සමනය සඳහා මනස සන්සුන් කිරිමේ අභ්‍යාස 02 ක් ලියන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(ix) ශ්‍රමය ප්‍රධාන කොටස් දෙකකට බෙදිය හැකිය. එම කොටස් 02 නම් කරන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(x) රැකියා සඳහා පුද්ගලයින් පුහුණු කිරීමේ ක්‍රම දෙකකට සිදු කළ හැකිය. එම ක්‍රම 02 ලියා දක්වන්න.

.............................................................................................................................................

.............................................................................................................................................

(ලකුණු 2 × 10 = 20 )

02. (i) පොදු සේවාවල පොදු ලක්ෂණ 02 ක් ලියන්න. ( ලකුණු 02 )

(ii) ඔබ ප්‍රදේශයේ පවතින පොදු සේවා 03 ක් ලියා දක්වන්න. ( ලකුණු 03 )

(iii) පරිසර සංරක්ෂණය සඳහා රජය මඟින් පිහිටුවා ඇති ආයතන 05 ක් නම් කරන්න. ( ලකුණු 05 )

03. (i) පාසල තුළ දක්නට ලැබෙන ප්‍රජාතන්ත්‍රවාදී ලක්ෂණ 02 ක් ලියා දක්වන්න. ( ලකුණු 02 )

(ii) සමාජය තුළ දැකිය හැකි විවිධ නායකත්ව ශෛලීන් 02 ක් ලියන්න. ( ලකුණු 03 )

(iii) ප්‍රජාතන්ත්‍රවාදී නායකයෙකු සතු විය යුතු ගුණාංග 05 ක් ලියන්න. ( ලකුණු 05 )

04. (i) හින්දු ආගම හා බැඳුණු සංස්කෘතික උත්සව 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

(ii) අප රටේ ආගම පදනම් කොටගෙන ගොඩනැගී ඇති සංස්කෘතීන් 03 ක් ලියා දක්වන්න. ( ලකුණු 03 )

(iii) බහු සංස්කෘතික ජන සමාජයක ලක්ෂණ 05 ක් ලියන්න. ( ලකුණු 05 )

05. (i) ස්වභාවික විපත් 03 ක් ලියන්න. ( ලකුණු 02 )

(ii) අනතුරු හා ආපදාවලදී සහාය ලබා ගත හැකි ආයතන 03 ක් සඳහන් කරන්න. ( ලකුණු 03 )

(iii) මහා මාර්ගයේ දී පදිකයන් අතින් සිදු වන වැරදි 05 ක් ලියන්න. ( ලකුණු 05 )

06. (i) විවිධ මාදිලියේ ගැටලු 02 ක් නම් කරන්න. ( ලකුණු 02 )

(ii) අභියෝග ජය ගැනීමට ප්‍රගුණ කළ යුතු මනෝ සාමාජීය නිපුණතා 03 ක් නම් කරන්න. ( ලකුණු 03 )

(iii) ගැටලු විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජන 05 ක් ලියන්න. ( ලකුණු 05 )

07. (i) පහත සඳහන් පාරම්පරික රැකියා සඳහා ප්‍රසිද්ධ ප්‍රදේශ කවරේදැයි ලියා දක්වන්න.

A - පිත්තල භාණ්ඩ

B - වෙස් මුහුණු ( ලකුණු 02 )

(ii) වැඩ ලෝකයේ පවතින ප්‍රධාන රැකියා ක්ෂේත්‍ර 03 ක් ලියා දක්වන්න. ( ලකුණු 03 )

(iii) වෘත්තීය පුහුණුව ලබා දෙන ආයතන 05 ක් නම් කරන්න. ( ලකුණු 05 )

# පුරවැසි අධ්‍යාපනය I, II

**8 ශ්‍රේණිය** **අවසාන් වාර පරීක්ෂණය - 2022**

## පුරවැසි අධ්‍යාපනය I

### ලකුණු දීමේ පටිපාටිය

| | | | | |
|---|---|---|---|---|
| 01. පොලිසියේ | 02. සුනාමි | 03. නායකයෙකු | 04. අනන්‍යතාවය | 05. ශ්‍රමාභිමානය |
| 06. √ | 07. √ | 08. X | 09. √ | 10. X |
| 11. (1) | 12. (3) | 13. (2) | 14. (4) | 15. (2) |
| 16. B | 17. D | 18. E | 19. A | 20. C |

## පුරවැසි අධ්‍යාපනය II

### ලකුණු දීමේ පටිපාටිය

01. (i) ප්‍රවාහනය / තැපැල් හා විදුලි පණිවිඩ සේවා / බැංකු සේවා

(ii) ජාතික ළමා ආරක්ෂක අධිකාරිය / පරිවාස හා ළමා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව /ළමා හා කාන්තා කාර්යංශය / ශ්‍රි ලංකා පොලිසිය

(iii) සෑම ජනවර්ගයකට ම අයත් පුද්ගලයන්ට ගරු කිරීම / සෑම ජනවර්ගයකට ම අයක් පුද්ගලයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම / කිසිදු ජනවර්ගයක්, ආගමික කණ්ඩායමක් උසස් හෝ පහත් හෝ කොට නොසැලකීම. (සුදුසු පරිදි ලකුණු ලබාදෙන්න)

(iv) ස්වාභාවික විපත් / මිනිස් ක්‍රියාකාරකම් නිසා ඇති වන විපත්

(v) අධ්‍යාපනය ලැබීම / සෞඛ්‍ය පහසුකම් ලබා ගැනීම / සමාජ සුරක්ෂිතතාවෙන් ප්‍රතිලාභ ලබා ගැනීම ආගමික විශ්වාසයන් ඇදීමේ නිදහස / නිදහස් අදහස් ප්‍රකාශ කිරීම / මිතුරු සබඳතා පැවැත්වීම / සමිති සමාගම් කටයුතුවලට සම්බන්ධ වීම / නිසි රැකවරණය ලැබීම

(vi) සිංහල / දෙමළ / මුස්ලිම් / බර්ගර් / මැලේ

(vii) අධිෂ්ඨානය / ඉවසීම / වීර්යය / උද්යෝගය / ආත්ම විශ්වාසය / උනන්දුව / කැපවීම / අනුවර්තනය

(viii) භාවනා කිරීම / මල් වැවීම / පරිසරය රසවිඳීම / ආගමික කටයුතුවල යෙදීම / සුරතල් සතුන් ඇති කිරීම

(ix) කායික ශ්‍රමය / මානසික ශ්‍රමය

(x) පූර්ව සේවා පුහුණුව / රැකියාව අතරතුර පුහුණුව

02. (i) කිසිදු භේදයකින් තොරව සියලු ම පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකි වීම. / ලාභ ඉපයීමට වඩා මහජන ශුභසිද්ධිය අරමුණු කරගෙන පවත්වාගෙන යාම / ජනතාවගේ ජීවන තත්ත්වයේ ගුණාත්මක සංවර්ධනය අරමුණු කරගෙන පවත්වා ගෙන යාම / අඩු ආදායම් ලාභීන්ට පහසුවෙන් ලබා ගත හැකි වීම / පුද්ගල සංවර්ධනය තුළින් සමාජ සංවර්ධනයට දායක වීම /මූලික අවශ්‍යතා ඉටු කර ගැනීමට සහාය වීම / පොදු සේවා පවත්වාගෙන යාම හා ආරක්ෂා කිරීම සඳහා නීතිරීති පද්ධතියක් ක්‍රියාත්මක වීම.

(ii) ජල සම්පාදනය / සෞඛ්‍ය සේවය / අධ්‍යාපනය / ප්‍රවාහනය / විදුලිය / පණිවිඩ හුවමාරු සේවා / තැපැල් සේවය /ආරක්ෂක සේවා / සමූපාකාරය

(iii) පරිසර අමාත්‍යාංශය / මධ්‍යම පරිසර අධිකාරිය / වන සංරක්ෂක දෙපාර්තමේන්තුව / වන ජීවි සංරක්ෂක දෙපාර්තමේන්තුව / භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය / සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය / වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව

03. (i) සාකච්ඡා මගින් නිවැරදි තීරණවලට එළඹීම / සෑම දෙනාගේ කැමැත්ත මත විමසීම හා එකඟවීම / නායකත්වයට ගරු කිරීම / සහයෝගයෙන් කටයුතු කිරීම / අධ්‍යාපනය, භෞතික සම්පත්, පෙළපොත්, නිල ඇඳුම්, පුස්තකාල, ක්‍රීඩා හා වෙනත් පහසුකම් සමාන ව ලැබීම / උපේක්ෂාවෙන් ජය පරාජය භුක්ති විඳීම හා සාමකාමී ව ගැටලු නිරාකරණය කර ගැනීම / සමිති සමාගම් තනතුරු ලබා ගැනීම, අදහස් ප්‍රකාශ කිරීම, ඡන්දය ලබා දීම / පාසල තුළ පවතින පොදු නීතිරීති, සම්ප්‍රදායන් පිළිගැනීම සහ ආරක්ෂා කිරීම

(ii) ඒකාධිපති නායකත්ව ශෛලිය / දූෂිත නායකත්ව ශෛලිය / නාමික නායකත්ව ශෛලිය / ප්‍රජාතන්ත්‍රවාදී නායක්තව ශෛලිය

(iii) මානව හිතවාදි බව / අවංකකම / කැපවීම / සමානාත්මතාව / මිත්‍රශීලී බව / නිර්මාණශීලි බව / නිවැරදි තීරණ ගැනීම / ආත්ම විශ්වාසය / ස්ථිරසාර බව / සවන් දීම / පක්ෂග්‍රාහී නොවීම / සමාජශීලී බව / දූරදක්නා නුවණ /අන් අයට උදව් කිරීම

04. (i) තෛපොංගල් උත්සවය / දීපවාලි උත්සවය / මහාශිව රාත්‍රී උත්සවය

(ii) බෞද්ධ සංස්කෘතිය / හින්දු සංස්කෘතිය / ක්‍රිස්තියානි / කතෝලික සංස්කෘතිය / ඉස්ලාම් සංස්කෘතිය

(iii) විවිධ ජනවර්ග ජීවත් වීම / විවිධ ආගම් අදහනු ලබන ජන කොටස් ජීවත් වීම. / විවිධ 'භාෂා කතා කරන ජන කොටස් ජීවත් වීම / විවිධ සිරිත්විරිත් දක්නය ලැබීම / විවිධ සංස්කෘතික උරුම පැවතීම

05. (i) ගංවතුර /නියඟ / කුණාටු/ ටොනාඩෝ / ලැව් ගිනි / අකුණු / භූ චලන / සුනාමි / භූමිකම්පා

(ii) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය / රෝහල / පොලිසිය / කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව / පළාත් පාලන ආයතන (මහනගර සභා / නගර සභා / ප්‍රාදේශිය සභා) / රතු කුරුස සංවිධානය / ගිනි නිවන ඒකකය / ත්‍රිවිධ හමුදාව (ආරක්ෂක අංශ)

(iii) මාර්ග සංඥා හා මාර්ග නීති පිළිබඳ සැලකිලිමත් නොවීම / මහමග දකුණු පසින් ගමන් නොකිරීම / පාර මාරු වීමේ දී කහ ඉර හෝ පදික මාරු හෝ භාවිත නොකිරීම / ජංගම දුරකථන භාවිත කරමින් ගමන් කිරීම / රාත්‍රි කාලයේ දී කළු හෝ අඳුරු ඇඳුම් ඇඳ ගමන් කිරීම / කණ්ඩායම් වශයෙන් ගමන් කිරීම

06. (i) භෞතික ගැටලු / මානසික ගැටලු / ආර්ථික ගැටලු / තාක්ෂණික ගැටලු / පරිසර ගැටලු / සමාජමය ගැටලු / කායික ගැටලු

(ii) චිත්තවේග ශැසිරවීම / ඵලදායී සන්නිවේදනය / ගැටලු විසඳීම / නිවැරදි තීරණ ගැනීම / විචාරශීලී චින්තනය / නිර්මාණශීලී චින්තනය / අන්තර් පුද්ගල සම්බන්ධතා / කරුණාව , මුදිතාව / තමා පිළිබඳ මනා අවබෝධය

(iii) අරමුණ ඉටු වීම / අසහනය දුරු වීම / සාමය ඇති වීම සුහදත්වය වර්ධනය / සහයෝගය වර්ධනය / නිවැරදි වීම / ගැටලු අවම වීම

07. (i) A - පිළිමතලාව / B - අම්බලංගොඩ

(ii) රාජ්‍ය අංශය හා අර්ධ රාජ්‍ය අංශය / පෞද්ගලික අංශය / ස්වයං රැකියා

(iii) වෘත්තිය පුහුණු අධිකාරිය / ජාතික ආධුනිකත්ව මණ්ඩලය / ජාතික තරුණ සේවා සභාව / කාර්මික විද්‍යාලය / උසස් තාක්ෂණික ආයතනය / විද්‍යාතා මධ්‍යස්ථානය / නැණසල / හෝටල් පාසල්

LOL.lk
BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
T
සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**